ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

SAPP

# කෘෂිකර්ම අමාත්‍යාංශය

## තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා තනි තනි උපදේශකයින් තෝරාගැනීම - උපදේශක - පරිසරය හා දේශගුණය හා උපදේශක - පෝෂණය

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) මගින් ඒ සඳහා හවුල්ව අරමුදල් සපයනු ලබයි. SAPP වැඩසටහන ශ්‍රී ලංකාවේ කුඩා ඉඩම් හිමියන්ගේ දරිද්‍රතාව අඩුකරලීම හා තරගකාරීත්වය කෙරෙහි දායක වීම සඳහා සැලසුම් කොට ඇත. වැඩසටහනෙහි සංවර්ධන අරමුණ වූ කලී වාණිජමය දිශාභිමුඛ නිෂ්පාදන හා අලෙවිකරණ පද්ධතීන් හා සම්බන්ධ කුඩා ඉඩම් හිමි ගෘහවාසී 57,500 ක ආදායම හා ආහාරවල තත්ත්වය තිරසාරව වර්ධනය කරලීමයි. රාජ්‍ය, පෞද්ගලික සහ නිෂ්පාදක හවුල්කාරීත්වයන් (4P) මගින් ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි ජාතික ප්‍රතිපත්ති අවශ්‍යාංග යටතේ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන්ට මෙම වැඩසටහන උපකාරී වෙයි.

පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍ය අයදුම්කරු, ප්‍රත්‍යක්ෂ නායකත්ව හා සාකච්ඡාකොට තීරණය කිරීමේ නිපුණතා, විශිෂ්ඨ කණ්ඩායම් කළමනාකරණ හැකියාවන් සහ සුවිශේෂී අන්තර් පුද්ගල නිපුණතා සහිත ඉමහත් අභිලාෂයෙන් යුත් ප්‍රතිඵල දිශානතික අයකු විය යුතුය.

### 01. උපදේශක - තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය - පූර්ණකාලීන (තනතුරු 01 යි)

**සුදුසුකම් හා පළපුරුද්ද**

- තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය, ව්‍යවසාය සංවර්ධනය, කෘෂි කාර්මික ව්‍යාපාර සංවර්ධනය හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි මාස්ටර් උපාධිය හෝ උසස් උපාධියක්.
- ව්‍යාපාර සැලසුම් සංවර්ධනය. තරුණ නිපුණතා සංවර්ධනය, ව්‍යවසාය සංවර්ධනය, ව්‍යාපෘති කළමනාකරණය යනාදිය පිළිබඳ වසර 1-2 ක පළපුරුද්ද.
- ව්‍යවසායකත්ව ජෛව පද්ධතිය, ප්‍රධාන ක්‍රීඩකයින්, අභියෝග හා අවස්ථාවන් පිළිබඳ අවබෝධය.
- සැලසුම් නිර්මාණය, ව්‍යවසාය සංවර්ධනය හා අලෙවිකරණ මූලෝපායන් පිළිබඳ ආවුද හා අභ්‍යාස පහසුකම් සැලසීම / බෙදහැරීම පිළිබඳ දැනුම.
- කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ පළපුරුද්ද අමතර වාසියකි.

**නුපුණතා හා ශක්‍යතා**

- අඩි උද්යෝගී හා දරිද්‍රතාව පිටුදැකීම සහ තරුණ බලගැන්වීම සඳහා කැපවීම.
- ඉංග්‍රීසි භාෂාව කථා කිරීමේ හා ලිවීමේ ක්‍රියාකාරී දැනුම.
- අනෙකුත් දේශීය භාෂාවලින් වැඩ කිරීමේ හැකියාව වාසිදායක ලෙස සැලකේ.
- නිශ්චිත අවසාන කාලසීමාවන් සපුරාලීමට අධි ප්‍රමාණීත ස්වාධීනත්වය, සුනම්‍යතාව හා හැකියාව.

### 02. උපදේශක - පරිසරය හා දේශගුණය - (තනතුරු 01 යි)

**සුදුසුකම් හා පළපුරුද්ද :**

පාරිසරික විද්‍යාව, පාරිසරික ඉංජිනේරු විද්‍යාව, තිරසර හා ශෝධක නිෂ්පාදනය, තිරසර කෘෂිකර්මය, තිරසර සංවර්ධනය හෝ සබැඳි ක්ෂේත්‍රයන්හි මාස්ටර් උපාධිය හෝ ඉහළ උපාධියක් සමග මාස්ටර් හෝ ඉහළ උපාධියෙන් පසු අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද. කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර හා තාක්ෂණවේදය පිළිබඳ ප්‍රථම උපාධියක් වඩාත් යෝග්‍ය වේ. ප්‍රදානයන් මගින් අරමුදල් ලබන ව්‍යාපෘතියක සමාන තරාතිරමක පළපුරුද්ද යෝග්‍ය වේ.

### 03. උපදේශක - පෝෂණය (තනතුරු - 01 යි)

**සුදුසුකම් හා පළපුරුද්ද :**

මානව පෝෂණය. මහජන සෞඛ්‍ය හෝ ආයතන පරිපාලනය, තිරසර කෘෂිකර්මය, තිරසර සංවර්ධනය හෝ සබැඳි ක්ෂේත්‍රයන්හි මාස්ටර් උපාධිය හෝ ඉහළ උපාධියක් සමග අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද. කෘෂිකර්ම ආහාර විද්‍යාව හෝ කෘෂි ව්‍යාපාර සහ තාක්ෂණවේදය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම වඩාත් යෝග්‍ය වේ. ප්‍රදානයන් මගින් අරමුදල් ලබන ව්‍යාපෘතියක සමාන තරාතිරමක පළපුරුද්ද යෝග්‍ය වේ.

**ගෙවීම් :**

සාකච්ඡාකොට තීන්දු කළ හැකිය. මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයට යොමුකිරීමේ අනුදේශ (TOR) අපගේ වෙබ් අඩවිය www.sapp.lk වෙතින් බාගත කරගත හැකිය. (අදාළ "යොමු කිරීමේ අනුදේශ" (TOR) බාගත කර ගැනීම සඳහා කරුණාකර "Download" ශීර්ෂයට හා "Procurement" උප ශීර්ෂයට යොමු වන්න) කරුණාකර ඔබේ යෝජනා (TOR පරිදි අදාළ විස්තර සහිත සම්පූර්ණ ජීවන තොරතුරු) 2023.01.13 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර පහත ලිපිනයට තැපැල් මගින් / අතින් ගෙනැවිත් භාර දෙන්න. නැතහොත් ඔබේ ජීව දත්ත, විද්‍යුත් තැපැලේ ශීර්ෂ විෂයට අයදුම් කරන තනතුර සඳහන් කොට procurement@sapp.lk වෙත ඊමේල් කරන්න.

කවරයේ වම් ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුරේ නාමය සඳහන් කරන්න. සභාපති, උපදේශකයින් ප්‍රසම්පාදන කමිටුව - ව්‍යාපෘති (CPCP), කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන, නො. 214/A, නාවල පාර, රාජගිරිය. වැඩිමනත් විස්තර සඳහා දුරකථන අංක 011-2448031 හෝ ඊමේල් gamini@sapp.lk මගින් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර ප්‍රසම්පාදන විශේෂඥ අමතන්න.

**වැඩසටහන් අධ්‍යක්ෂ,**
**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)**
**නො. 212/A, නාවල පාර, රාජගිරිය.**
**කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්බන්ධ කරගනු ලැබේ.**

Source: Dinamina, Daily News (2022.12.30)